*සැ. යු.*- 2016.01.14 දින පළ වූ අංක 1,950 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,951 - 2016 ජනවාරි මස 22 වැනි සිකුරාද - 2016.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 454 |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 පෙබරවාරි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ජනවාරි මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## නැගෙනහිර පළාත් සභාව

2015 අංක 03 දරන විසර්ජන ප්‍රඥප්තිය (පරිපූරක විධිවිධාන) 2015 දෙසැම්බර් මස 21 වැනි දින සභා සම්මත කර ලද බවත්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2015 දෙසැම්බර් මස 29 වැනි දින ලැබී ඇති බවත් මෙයින් දන්වමි.

එම්. සී. එම්. ෂෙරිෆ්,
සභා ලේකම්,
නැගෙනහිර පළාතේ පළාත් සභාව.

2015 දෙසැම්බර් මස 30 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

01-801

---

## දකුණු පළාත් සභාව

හම්බන්තොට මහා නගර සභාව

### සුසාන භූමි හා භූමදාන ආඥාපනත

හම්බන්තොට මහා නගර සභා බල ප්‍රදේශයට අදාළව 231 වන අධිකාරය වූ සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ නිසි බලධාරියා වන හම්බන්තොට මහා නගර සභාවේ නිර්දේශය මත, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ආඥාපනතේ 5 වන වගන්තියේ දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ නීතිය හා සාමය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පළාත් පාලන, ප්‍රවාහන හා සංචාරක අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම මලවුන් වැළලීම හෝ ආදහනය කිරීම පිණිස වෙන් කරන ලද පොදු සුසාන භූමියක් වශයෙන් භාවිතා කිරීමට මෙයින් නියම කරමි.

ෂාන් විජයලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක හා
ඉංජිනේරු සේවා අමාත්‍ය, දකුණු පළාත.

2015 දෙසැම්බර් මස 21 වැනි දින,
ලබුදූව, ''දක්ෂිණපාය'' යේ දී ය.

*උපලේඛනය*

1. (අ) ගල්වල පාර බෞද්ධ සුසාන භූමිය

බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. ඩී. සුගතපාල මහත්මා විසින් පිළියෙළ කරන ලද 2002.04.30 දිනැති හා අංක 148 දරන පිඹුරේ විස්තර කර ඇති දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම්පත්තුවේ හම්බන්තොට මහා නගර සභා සීමාව තුළ පිහිටි ගල්වල ගමෙහි බැද්දවල නැමති ඉඩමෙහි අංක 01 දරන අක්කර 01, රූඩ් 01, පර්චස් 05.02 (හෙක්ටයාර් 0.533)ක් විශාල ඉඩම් කැබැල්ලට මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | හම්බන්තොට - තිස්ස ප්‍රධාන පාර |
| *නැගෙනහිරට* | : | බැද්දවල නගර සභා නිවාස ගෙවත්ත |
| *දකුණට* | : | ඇළ රක්ෂිතය |
| *බටහිර* | : | බැද්දවල නගර සභා නිවාස ගෙවත්ත. |

01-634

---

## නැගෙනහිර පළාත් සභාව

2015 අංක 04 දරන විසර්ජන ප්‍රඥප්තිය 2015 දෙසැම්බර් මස 23 වැනි දින සභා සම්මත කර ලද බවත්, මේ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2015 දෙසැම්බර් මස 29 වැනි දින ලැබී ඇති බවත් මෙයින් දන්වමි.

එම්. සී. එම්. ෂෙරිෆ්,
සභා ලේකම්,
නැගෙනහිර පළාතේ පළාත් සභාව.

2015 දෙසැම්බර් මස 30 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
නැගෙනහිර පළාතේ පළාත් සභාව,
ඇතුල් වරාය පාර,
ත්‍රිකුණාමලය.

01-802

---

## 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති සංශෝධන පනත් සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(3) වගන්තිය හා පූර්වෝක්ත පනතේ 50 සහ 57(2) වගන්තිය යටතේ ආඥාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති සංශෝධන පනත් සමග කියවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(3) වගන්තිය යටතේ දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් තැන වශයෙන් තත්කාලයේ ක්‍රියා කිරීමට පත්කර ඇති දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් සීනාකෝරලයාලාගේ විමල් සිසිර කුමාර වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පූර්වෝක්ත පනතේ 5 හා 6 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද පහත සඳහන් සමුපකාර සමිති, 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 50 සහ 57(2) වගන්තිය අනුව අවලංගු කළ බව මෙයින් දැනුම් දෙමි.

එස්. කේ. ඩබ්. එස්. කුමාර,
සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්,
දකුණු පළාත.

2015 ඔක්තෝබර් මස 07 වැනි දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (දකුණු පළාත),
අංක 147/3, පෙට්ටිගලවත්ත,
ගාල්ල.

උපලේඛනය

*හම්බන්තොට දිස්ත්‍රික්කය*

| *අනු. අංකය* | *පෙර තිබූ ලියාපදිංචි අංකය* | *සමිතියේ නම* | *වසා දමන ලද දිනය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 1 | හ/තංග/18 | සීමාසහිත තංගල්ල පොල් සංවර්ධන සමුපකාර සමිතිය | 2008.08.04 | හම්බන්තොට |
| 2 | හ/328 | සීමාසහිත කණුමුල්දෙණිය බීඩි කර්මාන්ත සමුපකාර සමිතිය | 2004.07.31 | හම්බන්තොට |
| 3 | හ/සූරි/12 | සීමාසහිත සූරියවැව ගෘහ කර්මාන්ත සමුපකාර සමිතිය | 2004.04.30 | හම්බන්තොට |
| 4 | හම්/සූරි/03 | සීමාසහිත මීගහජඳුර සම්භාණ්ඩ කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | 2003.02.28 | හම්බන්තොට |
| 5 | හ/535 | සීමාසහිත තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විවිධ කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | 2004.12.15 | හම්බන්තොට |
| 6 | හ/555 | සීමාසහිත වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සම්භාණ්ඩ කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | 2005.07.31 | හම්බන්තොට |
| 7 | හ/287 | සීමාසහිත තංගල්ල ධීවර සමුපකාර සමිතිය | 2005.08.20 | හම්බන්තොට |
| 8 | හ/550 | සීමාසහිත ගොඩඋඩ කන්ද සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය | 2015.10.07 | හම්බන්තොට |

*ගාල්ල දිස්ත්‍රික්කය*

| | | | | |
|---|---|---|---|---|
| 1 | ගා/1955 | සීමාසහිත ගාල්ල සංවර්ධන සමුපකාර සමිතිය | 2004.06.30 | ගාල්ල |
| 2 | ජී/1766 | සීමාසහිත ගාල්ල දිස්ත්‍රික්කයේ ආයුර්වේද ඖෂධ නිපදවන හා අළෙවි කිරීමේ සමුපකාර සමිතිය | 2015.03.31 | ගාල්ල |
| 3 | ගා/2415 | සීමාසහිත දකුණු පළාත් ජනසවි හා විවිධ නිෂ්පාදන අළෙවි හා අළෙවි සංවර්ධන සමුපකාර සමිතිය | 2015.03.31 | ගාල්ල |
| 4 | ජී/1586 | සීමාසහිත උතුරු මාගල විවිධ සේවා සමුපකාර සමිතිය | 2009.11.03 | ගාල්ල |
| 5 | ජී/1098 | සීමාසහිත කොස්ගොඩ ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අළෙවි කිරීමේ සමුපකාර සමිතිය | 2010.07.23 | ගාල්ල |
| 6 | ගා/2361 | සීමාසහිත අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විවිධ කාර්මිකයන්ගේ සමුපකාර සමිතිය | 2009.11.03 | ගාල්ල |
| 7 | ජී/1759 | සීමාසහිත රිච්මන්ඩ් විද්‍යාලයීය විවිධ සේවා සමුපකාර සමිතිය | 2011.01.31 | ගාල්ල |
| 8 | ජී/1790 | සීමාසහිත ගාල්ල දිස්ත්‍රික් ධාන්‍යාගාර කම්කරු සමුපකාර සමිතිය | 2011.01.31 | ගාල්ල |
| 9 | ජී/1067 | සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සංගමය | 2010.05.21 | ගාල්ල |
| 10 | ගා/2410 | සීමාසහිත බෙන්තොට ජනකලා කේන්ද්‍රයට අනුබද්ධිත විවිධ කලාකරුවන්ගේ සමුපකාර සමිතිය | 2010.07.27 | ගාල්ල |
| 11 | ගා/2369 | සීමාසහිත දක්ෂිණ ලංකා මගී ප්‍රවාහන සමුපකාර සමිතිය | 2012.09.11 | ගාල්ල |
| 12 | ගා/1949 | සීමාසහිත අක්මීමන ප්‍රාදේශීය සංවර්ධන සමුපකාර සමිතිය | 2015.10.07 | ගාල්ල |
| 13 | ගා/1980 | සීමාසහිත කුරුපනාව කුඩා තේ වතුහිමියන්ගේ සමුපකාර සමිතිය | 2015.10.07 | ගාල්ල |

*මාතර දිස්ත්‍රික්කය*

| | | | | |
|---|---|---|---|---|
| 1 | මාර/මාලි/ප්‍රාලේ/සමු/07 | සීමාසහිත හොරගොඩ කුඩා රබර් වතුහිමියන්ගේ හා රබර් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය | 2005.02.05 | මාතර |
| 2 | මාර/753 | සීමාසහිත පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විවිධ සේවකයින්ගේ සමුපකාර සමිතිය | 2005.08.12 | මාතර |
| 3 | මාර/611 | සීමාසහිත වැලිගම පරණ කඩේ සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2010.01.28 | මාතර |
| 4 | මාර/568 | සීමාසහිත ජන විකුම්ගම සකසුරුවම් හා ණය ගණුදෙණු පිළිබඳ සමුපකාර සමිතිය | 2010.01.21 | මාතර |
| 5 | මාර/සමු/1011 | සීමාසහිත දෙවිනුවර මැතිවරණ කොට්ඨාසයේ පිටත සවිකරණ යන්ත්‍ර සහිත යාත්‍රාකරුවන්ගේ ධීවර සමුපකාර සමිතිය | 2012.11.29 | මාතර |

01-877

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

ඌව පළාත් සභා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින මැහුම් උපදේශිකා තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත ඌව පළාතේ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2016.02.15 දින වේ.

*බඳවා ගන්නා ශ්‍රේණිය.-* මැහුම් උපදේශිකා - III ශ්‍රේණිය.

*වැටුප් පරිමාණය (මාසික).-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006(iv) හි MN 1-2006A වැටුප් කේත අංකය අනුව රු. 13,120 - 10x145 - 11x170 - 10x240 - 10x320 - රු. 20,040.

02. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-*

(අ) මෙම තනතුර සඳහා ස්ත්‍රී පාර්ශ්වයට පමණක් අයදුම් කළ හැකිය.

(ආ) අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ඇ) සෑම අපේක්ෂිකාවකම යහපත් චරිතයකින් හා ඌව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක් විය යුතුය.

(ඈ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඌව පළාත තුළ අවම වශයෙන් පූර්වාසන්න වසර 03ක ස්ථිර පදිංචිය ඇති අයදුම්කාරියන් විය යුතු අතර ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන, ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද නියමිත ආකෘතිය මගින් සම්මුඛ පරීක්ෂණයේ දී පදිංචිය සනාථ කළ යුතු ය.

(ඉ) මෙම තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය බවට මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ඊ) *වයස.-* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

03. *අධ්‍යාපන සුදුසුකම් :*

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම,

හෝ

(ii) ජාතික පොදු සහතික පත්‍ර විභාගයෙන් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් සමත්ව තිබීම,

සහ

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 03ක් සමත්ව තිබීම,

සහ

(iv) මැහුම් වැඩ, ගෘහ විද්‍යාව සහ එම්බ්‍රොයිඩර් වැඩ හා හස්ත කර්මාන්ත, රූපලාවන්‍ය පිළිබඳව වසරක රාජ්‍ය ආයතනයක ඩිප්ලෝමාවක් හදාරා සමත්ව තිබීම.
*උදා.-* ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගෘහ කළමනාකරණ ඩිප්ලෝමාව.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බාහිර අයදුම්කරුවන්ගෙන් පමණක් බඳවාගනු ලැබේ. විවෘත තරග විභාගයේ දී ලබාගන්නා ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත පවත්වනු ලබන සහතික පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

ලිඛිත පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් ලකුණු 40%ක් ලබාගත යුතු ය. ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශය පහත පරිදි වේ.

06. *තරග විභාගයේ විෂය නිර්දේශය.*- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| 1 | අභියෝග්‍යතාවය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය හා නිවැරදි තීරණ ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | පැය 1 | 100 | 40% |
| 2 | සාමාන්‍ය දැනීම | ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ සමාජ ආර්ථික දේශපාලන තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. | පැය 1 | 100 | 40% |

07. *අයදුම් කළ යුතු පිළිවෙල.*- මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කරගත යුතු ය. අයදුම්පත්‍රයේ ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. අංක 01 සිට 04 දක්වා කොටස් පළමු පිටුවට ද ඉතිරිය දෙවන හා තෙවන පිටුවලට ද ඇතුළත් වන සේ ඉල්ලුම්පත්‍රය තමන් විසින්ම සකස් කර ගත යුතු අතර, ඒ ඒ ශීර්ෂයන් ලබා දී ඇති උපදෙස් අනුව පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ම අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂය දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2016.02.15 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ''ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

08. *අත්සන සහතික කිරීම.*- අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන රු. 230,700ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන මාණ්ඩලික මට්ටමේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

09. *විභාග හා පරිපාලන වියදම්.*- විභාග ගාස්තු හා පරිපාලන වියදම් රු. 400කි. මෙම මුදල ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13 ට බැර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට අලවා එවිය යුතුය. ලදුපතේ මුල්පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

10. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් හට සහතික පරීක්ෂා කිරීමකින් තොරව තරග විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම ලබා දීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

11. විවෘත තරග විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් බදුල්ල නගරයේ දී පවත්වනු ලැබේ. තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පමණක් පවත්වනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මුළු විභාගය සඳහා පෙනී සිටිය හැකිය. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12. විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

13. *සාවද්‍ය තොරතුරු සැපයීම.*- මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුව ද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දන දනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඇයගේ සේවය පූර්ව දැනුම්දීමකින් තොරව අවසන් කරනු ලැබේ.

14. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව හෝ මේ සම්බන්ධයෙන් වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බදුල්ල,
2016 ජනවාරි මස 06 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016***

| |
|---|

කාර්යාලීය ප්‍රයෝජනය පිණිසයි

A. ඔබ අයත් වන දිස්ත්‍රික්කය : | | |
(බදුල්ල - 01/මොණරාගල - 02)

B. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : | | |
(සිංහල - 01/දෙමළ - 02)

01. 1.1 මුලකුරු සමග නම : Mr./Mrs./Miss :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA A. B. C.
1.2 සම්පූර්ණ නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :——————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :——————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 දුරකථන අංකය :——————.

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1/පුරුෂ - 0 | |
3.2 උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |
3.3 2016.02.15 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |
3.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

04. 4.1 2016.02.15 වැනි දිනට ඌව පළාතේ ස්ථිර පදිංචි කාලසීමාව : අවුරුදු : | | | මාස : | | | දින : | | |
4.2 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද ? :——————.
4.3 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
4.4 පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.

05. අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ. පො. ස. (සා/පෙළ) විභාගය :
1. වර්ෂය :——————. 2. විභාග අංකය :——————.

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

5.2 අ. පො. ස. (උ/පෙළ) විභාගය :
1. වර්ෂය :————————. 2. විභාග අංකය :————————.

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 හදරා ඇති මැහුම් ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ විස්තර :

| පාඨමාලාවේ නම | ලබාගත් ආයතනය | කාලසීමාව | වලංගුවන දිනය | හදරා ඇති විෂයන් |
|---|---|---|---|---|
| | | | | |

06. වෙනත් සුදුසුකම් :————————.

07. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? ඔව්/නැත
ඔව් නම් විස්තර සඳහන් කරන්න :————————.

08. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් සේවය කරන දෙපාර්තමේන්තුවේ නම හා ලිපිනය :—————.

09. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර :
9.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————————.
9.2 ලදුපත් අංකය :————————.
9.3 ගෙවූ මුදල :————————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

10. අයදුම්කරුගේ සහතිකය :

(i) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි. තව ද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ii) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................ ලිපිනයේ පදිංචි ............................................ මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඇය ......................... දින මා ඉදිරිපිටදී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :————————.

————————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————————.
තනතුර :————————.
ලිපිනය :————————.

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
(දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

ඉහත තොරතුරු සඳහන් කර ඇති ................................................ මිය./මෙනවිය ........................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන බවද, ........................................... දින සිට ............................... තනතුරක සේවයේ යෙදී සිටින බවද, ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය තෝරාගනු ලැබුවහොත් ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන/නොකරන බවද සහතික කරමි.

දිනය :——————.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.

01-839/1

---

## ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පවතින තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2016

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඌව පළාතේ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් 2016.02.15 දින දක්වා භාරගනු ලැබේ.

02. *බඳවා ගන්නා ශ්‍රේණිය :*
1. කාර්මික නිලධාරි (සිවිල්/යාන්ත්‍රික/විදුලි) - III ශ්‍රේණිය හා පුහුණු කිරීමේ ශ්‍රේණිය
2. සැලසුම් ශිල්පි - පුහුණු කිරීමේ ශ්‍රේණිය

03. *වැටුප් ක්‍රමය (මාසික) :*

(i) කාර්මික නිලධාරි (සිවිල්/යාන්ත්‍රික/විදුලි) - III වන ශ්‍රේණිය :
අංක 6/2006(IV) හා අංක 7/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි MN3-2006A අනුව රු. 15,005 - 4x180 - 6x240 - 11x320 - 20x360 - රු. 27,885 මාසික වැටුප් පරිමාණය හිමි වේ.

(ii) කාර්මික නිලධාරි (සිවිල්/යාන්ත්‍රික/විදුලි) හා සැලසුම් ශිල්පි පුහුණු කිරීමේ ශ්‍රේණිය :
පළමු වසර - රු. 12,920.00
දෙවන වසර - රු. 13,040.00

04. *බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

(අ) අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ආ) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.

(ඇ) අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවම වශයෙන් වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් ඌව පළාත තුළ තිබිය යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ලබන පදිංචිය පිළිබඳ ග්‍රාම සේවා සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.

(ඈ) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය, පළාත් සභා රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

05. *බඳවා ගැනීමේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

5.1 5.1.1 කාර්මික නිලධාරි (සිවිල්) - පුහුණු කිරීමේ ශ්‍රේණිය :

(අ) ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම,

හෝ

(ආ) ඉහත (අ) හි සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (සිවිල්) තුන් අවුරුදු අර්ධකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

5.1.2 කාර්මික නිලධාරි (සිවිල්) - III වන ශ්‍රේණිය

5.1.1 (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ; හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව ; හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව ; හෝ

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ; හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ; හෝ

(vi) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.2 5.2.1 කාර්මික නිලධාරි (යාන්ත්‍රික) - පුහුණු කිරීමේ ශ්‍රේණිය :

(අ) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා විෂයන් තුනකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම, හෝ

(ආ) ඉහත (අ) හි සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (යාන්ත්‍රික) තුන් අවුරුදු අර්ධකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදළ සහතිකය ලබා තිබීම.

5.2.2 කාර්මික නිලධාරි (යාන්ත්‍රික) - III වන ශ්‍රේණිය :

5.2.1 (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය :

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව, හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව, හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව, හෝ

(iv) ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.3 5.3.1 කාර්මික නිලධාරි (විදුලි) - පුහුණු කිරීමේ ශ්‍රේණිය :

(අ) භෞතික විද්‍යාව, රසායන විද්‍යාව ඇතුළත්ව විද්‍යා විෂයන් තුනකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම,

සහ

(ආ) ඉහත 5.3.1 (අ) හි සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ජාතික තාක්ෂණික සහතිකය (විදුලි) තුන් අවුරුදු අර්ධකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

5.3.2 කාර්මික නිලධාරි (විදුලි) - III වන ශ්‍රේණිය :

5.3.1 (අ) හි සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව, හෝ

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව, හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව, හෝ

(iv) ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.4 සැළසුම් ශිල්පි - පුහුණු කිරීමේ ශ්‍රේණිය :

(අ) ක්ෂේත්‍රයට අදළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ. පො. ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව යන තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06කින් අ. පො. ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත්වීම, හෝ

(ආ) ඉහත (අ) හි සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදළ සහතිකය ලබා තිබීම.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවාගනු ලැබේ.

(ii) මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් ලිඛිත තරග විභාගයක් පවත්වා ලබා ගන්නා ඉහළම ලකුණුවල ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

(iii) සියළුම සුදුසුකම් සහිත විධිමත් අයදුම්පත් සංඛ්‍යාව, පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අඩු වන්නේ නම් ලිඛිත තරග විභාගයක් නොපවත්වන අතර, සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් පමණක් සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

(iv) **කාර්මික නිලධාරි (සිවිල්)**
ඉහත 5.1.1(අ)හි සඳහන් සුදුසුකම් සහිතව පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන නිලධාරීන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද, 5.1.1(අ) සහ (ආ)හි සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද යටත් කර පත්වීම ලබාදෙනු ලැබේ.

**කාර්මික නිලධාරි (යාන්ත්‍රික)**
ඉහත 5.2.1(අ) හි සඳහන් සුදුසුකම් සහිතව පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරා ගනු ලබන නිලධාරීන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද, 5.2.1 (අ) සහ (ආ) හි සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද යටත් කර පත්වීම් ලබාදෙනු ලැබේ.

**කාර්මික නිලධාරි (විදුලි)**
ඉහත 5.3.1(අ) සහ (ආ) හි සඳහන් සුදුසුකම් සහිතව පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන අයදුම්කරුවන්හට එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට යටත් කර පත්වීම් ලබාදෙනු ලැබේ.

**සැලසුම් ශිල්පි (පුහුණු කිරීමේ ශ්‍රේණිය)**
ඉහත 5.4(අ) හි සඳහන් සුදුසුකම් සහිතව පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරාගනු ලබන නිලධාරීන් දෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද, 5.4(අ) සහ (ආ) හි සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන් එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකට ද යටත් කර පත්වීම් ලබාදෙනු ලැබේ.

(v) ඉහත එක් එක් තනතුර සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගන්නා අයදම්කරුවන් අදළ පුහුණු කාල සීමාව අවසානයේදී මෙම කොමිෂන් සභාවේ විභාග ඒකකය/ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන III වන ශ්‍රේණියට පත් කිරීමේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය. එම යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමෙන් පසු III වන ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

(vi) යෝග්‍යතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත්, ඔවුනට මාස 06කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන පරීක්ෂණය අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

07. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගන්නා නිලධාරීන් ඌව පළාත තුළ කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 ප්‍රකාරව පත්වීම් දින සිට වසර පහක් (05)ක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

08. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-* මෙම නිවේදනයේ අගට යොද ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් එහි අංක 01 සිට 04 දක්වා තොරතුරු පළමු පිටුවට ද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද වන සේ කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු අතර, ඒ ඒ ශීර්ෂයන් පැහැදිලිව තම අත් අකුරින්ම විභාගයට ඉදිරිපත්වීමට අපේක්ෂිත භාෂා මාධ්‍යයෙන් ම සම්පූර්ණ කළ යුතු වේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත 2016.02.15 දිනට හෝ එදිනට ප්‍රථම ''ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පීලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. දනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ........................... තනතුර සඳහා බඳවා ගැනීම - 2016'' යනුවෙන් සටහන් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන, අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ඉදිරිපත් වන, අඩුපාඩු සහිත හා ඉල්ලුම් කරනු ලබන තනතුරට අදළ සුදුසුකම් රහිත අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. *අත්සන සහතික කිරීම.*- මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 2,30,700ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10. *විභාග හා පරිපාලන ගාස්තු.*- විභාග හා පරිපාලන ගාස්තු වශයෙන් රු. 400ක මුදලක්, ඌව පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ''ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.12''ට බැර කර ලබාගන්නා අදාළ ලදුපත නොගැලවෙන සේ අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ අලවා එවිය යුතු ය. මෙහි දී ලදුපතේ මුල් පිටපත අයදුම්පත්‍රයට අමුණා එවීම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එහි ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම වැදගත් වේ. ඌව පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතු ය.

11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.02.15 දිනට මෙම නිවේදනයේ සඳහන් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති, පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි විධිමත් අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇත්නම් පමණක් එකී අයදුම්කරුවන් සහතික පත්‍ර පරීක්ෂා කිරීමකින් තොරව විවෘත තරග විභාගයකට ඉදිරිපත් කරනු ලැබේ. තරග විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට වූ පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

12. මෙම විභාගය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකය මගින් පවත්වනු ලබන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයෙකු මුළු විභාගයටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13. විභාග දිනයේ දී අපේක්ෂකයාගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත 'අ' සහ 'ආ' හි සඳහන් ලියවිලි හැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

14. *විවෘත තරග විභාග හා ඊට අදළ විෂය නිර්දේශය සම්බන්ධ තොරතුරු.*- විභාග ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ :

*අභියෝග්‍යතාවය.*- (කාලය පැය 01යි. - ලකුණු 100යි).

මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ භාෂාමය කුසලතාවය, සංඛ්‍යාමය හැකියාව, තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණ සංස්ලේෂණ හැකියාව, ඉක්මනින් නිවැරදි තීරණ ගැනීමේ හැකියාව ආදිය මැන බැලීම සඳහා සකස්කළ බහුවරණ හා ව්‍යුහගත රචනා ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

*සාමාන්‍ය දැනීම.*- (කාලය පැය 01 1/2යි - ලකුණු 100යි)

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ආර්ථික, දේශපාලන, සමාජ තොරතුරු ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි.

** විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

15. *සාවද්‍ය තොරතුරු සැපයීම.*- මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

16. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සිදුකිරීම/නොකිරීම හෝ කොටසක් සම්පූර්ණ කිරීම හෝ මේ සම්බන්ධයෙන් කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ අයිතිය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණය කිරීම ද, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් කරනු ඇත.

ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,
ලේකම්,
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 14/4, පීලිපොතගම පාර,
පිංඅරාව, බදුල්ල,
2016 ජනවාරි මස 06 වැනි දින.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ...................................... තනතුරට බඳවා ගැනීම - 2016**

A. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් අනුව, ඔබ අයදුම් කරන තනතුර හා ශ්‍රේණිය සඳහන් කරන්න) :

B. ඔබ අයත් වන දිස්ත්‍රික්කය සඳහන් කරන්න :

C. භාෂා මාධ්‍යය (සිංහල - 01/දෙමළ 02/ඉංග්‍රීසි 03) :

01. 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) Rev./Mr./Mrs./Miss :———————.
උදා : PERERA A. B. C.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———————.

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :———————.
2.3 දුරකථන අංකය :———————.

03. 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1/පුරුෂ - 0
3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
3.3 2016.02.15 දිනට වයස : අවුරුදු : මාස : දින :
3.4 ජාතික හැඳුනුම්පත් අංකය :

04. 4.1 දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින්නේ කවදා සිටද ? :———————.
4.2 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :———————.
4.3 පදිංචි ග්‍රාම නිලධාරි කොට්ඨාසය :———————.

05. අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ. පො. ස. (සා/පෙළ) විභාගය :
වර්ෂය :———————. විභාග අංකය :———————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

5.2 අ. පො. ස. (උ/පෙළ) විභාගය :
වර්ෂය :———————. විභාග අංකය :———————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

5.3 ලබාගෙන ඇති ඩිප්ලෝමාව/වෙනත් පාඨමාලා සම්බන්ධ පිළිබඳ විස්තර :

| *ඩිප්ලෝමාව/ පාඨමාලාවේ* | *ආයතනය* | *විෂයයන්* | *වලංගුවන දිනය* |
|---|---|---|---|
| | | | |

06. වෙනත් සුදුසුකම් :———————.

07. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? ඔව්/නැත
ඔව් නම් විස්තර සඳහන් කරන්න :———————.

08. විභාග හා පරිපාලන ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර :
8.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———————.
8.2 මුදල් ගෙවූ දිනය හා ලදුපත් අංකය :———————.
8.3 ගෙවූ මුදල :———————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

09. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

———————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................... මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී .................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

දිනය :———————.

———————,
අත්සන සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :———————.
තනතුර :———————.
ලිපිනය :———————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

11. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

ඉහත තොරතුරු සඳහන් ................................................................................ මහතා/මහත්මිය/මෙනවිය .............................................................................. දින සිට .............................. කර්යාලයේ .................................. තනතුරක සේවය කරන බව සහතික කරමි. ඔහු/ඇය 2016.02.15 දිනට පූර්වාසන්න වසර ...............ක කාලය තුළ (අවවාද කිරීම් හැර) කිසිදු විනය දඬුවමක් ලබා නොමැති, නියමිත දිනට වැටුප් වර්ධක උපයාගෙන ඇති, සතුටුදායක සේවා කාලයක් සහිත ස්ථිර නිලධාරියකු බව ද, පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරන/නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි. (අනවශ්‍ය වචන කපා හරින්න).

දිනය :———————.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :———————.
තනතුර :———————.
ලිපිනය :———————.
(නිල මුද්‍රාව තබන්න)

01-839/2

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක II ''ආ'' බණ්ඩයට (III ශ්‍රේණියට), සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2016

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක II ''ආ'' බණ්ඩය (III ශ්‍රේණිය), සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාත තුළ ස්ථිර පදිංචි, සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :*

 1.1 අයැදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

 1.2 වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ අයැදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්නයේ නොකඩවා වසර 03 ක් ස්ථිරවම පදිංචිව සිටි බව සනාථ කළ යුතුය.

 13. අයැදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

 (දැනටමත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් දරන නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල පවත්වනු නොලැබේ.)

 14. තෝරා ගනු ලැබීම සඳහා අයැදුම්කරුවන් මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු අතර මනා චරිතයකින් යුක්ත විය යුතුය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් :*

| *තනතුරු නාමය* | *තනතුරු සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම්* | *එක් එක් තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| කෘෂිකර්ම උපදේශක IIආ බණ්ඩය (III ශ්‍රේණිය) | භාෂාව සහ සාහිත්‍ය ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව (එනම් සම්මාන සාමාර්ථ 04 ක් සහිතව) විෂයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී (විෂයන් 05 ක් එකවර සමත්ව තිබිය යුතුය.) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාග යෙන් සමත් වීම. | භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් (02)ක් සහිතව විද්‍යා විෂයන් තුන (03) කින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර එකවර සමත්වීම. (පැරණි නිර්දේශය) හෝ කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් (දෙකක් 02) සමඟ විද්‍යා විෂයයන් තුන (03) කින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම. (නව විෂය නිර්දේශය) | (i) කුණ්ඩසාලේ, අගුණකොලපැලැස්ස, පැල්වෙහෙර, ලබ්බුදුව, වාරියපොල, බිබිල, අනුරාධපුර, කරපිංච හා වවුනියාව යන කෘෂිකර්ම විද්‍යාල මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ; හෝ<br>(ii) ඇක්වයිනාස් විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ<br>(iii) අම්පාර හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්ම පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම.<br>හෝ<br>(iv) ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සමාන හෝ උසස් සුදුසුකම් ලබා තිබීම. |
| සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය | ඉහත පරිදි වේ. | ඉහත පරිදි වේ. | (i) රජය පිළිගත් සත්ත්ව පාලන විද්‍යාලයකින් පිරිනමන ලද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව අනුමත කරන ලද සත්ත්ව පාලනය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ<br>(ii) රජය පිළිගත් ආයතනයකින් පිරිනමන ලද සත්ත්ව පාලන විෂයයක් සහිත කෘෂිකර්ම ඩිප්ලෝමාවක් ලබා තිබීම. (ප්‍රමුඛතාවය ලබා දෙනුයේ සත්ත්ව පාලන ඩිප්ලෝමාව සඳහායි. සුදුසුකම් ලබන අය නොසිටියහොත් පමණක් මෙම සහතිකය පිළිබඳ සලකා බලනු ලැබේ.) |

*සැ. යු.*- ඉහත සියලු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් 2016.02.23 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුයි.

3. *වැටුප් පරිමාණය :*

 3.1 කෘෂිකර්ම උපදේශක/සත්ව සංවර්ධන උපදේශක - III ශ්‍රේණිය
 රු. 15,005- 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 - රු. 27,885 කි. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (vi) හි MN3 - 2006A වැටුප් ක්‍රමය).

4. *සේවා කොන්දේසි :*

4.1 තාක්ෂණ සේවයේ II පන්තියේ "ආ" ඛණ්ඩයේ (III ශ්‍රේණියේ) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නේ අදාළ වන පරිදි අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වනු ඇත.

4.3 දැනටමත් වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර නිලධාරියෙකු නම් අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ නියමිත දිනට වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර සේවා කාලය සතුටුදායක විය යුතුය.

4.4 බඳවා ගන්නා ලද නිලධාරීන් වයඹ පළාත තුළ ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතුය. වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන කවර හෝ ප්‍රදේශයක අනිවාර්යෙන් වසර 05 ක් සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.5 ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවල විධිවිධාන තනතුරට ගැළපෙන පරිදි අදාළ වනු ඇත. තවද මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයටද, දෙපාර්තමේන්තු නියෝගවලටද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට ද, රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතුය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය :*

5.1 පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයැදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි අයැදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මධ්‍යයෙන් කුරුණෑගල දී පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන ලද මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.2 බඳවා ගැනීමේ ප්‍රතිශතයන් :-
(ආ) කෘෂිකර්ම උපදේශක
විවෘත තරඟ විභාගයෙන් 90% හා සීමිත තරඟ විභාගයෙන් 10%
(ඇ) සත්ත්ව සංවර්ධන උපදේශක - සියලු පුරප්පාඩු පිරවීම විවෘත තරඟ විභාගයෙන්

5.3 විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබාගත් අයැදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. එම ලේඛනයේ අනුපිළිවෙල අනුව හා පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

5.4 අදාළ ක්ෂේත්‍රයේ සීමිත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් දෙපාර්තමේන්තු සේවකයින් නොසිටියහොත් මුලු පුරප්පාඩු ප්‍රමාණයම විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලබන අතර, එය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අනුව ක්‍රියාත්මක කරනු ලැබේ.

6. *විභාග විෂයය නිර්දේශය :*
විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂය නිර්දේශයන් ඇමුණුම 01 හි දක්වා ඇත.

| තනතුර | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු |
|---|---|---|---|
| 1. කෘෂිකර්ම උපදේශක II "ආ" (III ශ්‍රේණියට) | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 |
| | තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 |
| 2. සත්ත්ව සංවර්ධන උපදේශක | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 |
| | සාමාන්‍ය දැනීම | පැය 1 1/2 | 100 |

සැ. යු.- බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ එක් එක් ප්‍රශ්ණ පත්‍රය සඳහා ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලබා ගතහොත් පමණි.

7. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*
ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයැදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

8. *විභාග ගාස්තු :*
විභාග ගාස්තු වශයෙන් රු. 500ක මුදලක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතුය. වයඹ පළාතේ පදිංචි අයදුම්කරු/අයදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එම මුදල ගෙවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ව. ප. ස. මූ. 02 ලදුපත අයදුම්පත්‍රයට අමුණා ඉදිරිපත් කළ යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට් පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය.

9. *අයදුම් කළ යුතු ක්‍රමය :*

අයදුම්පත්‍ර ඒ 4 (සෙ. මී. 21 x 29 ) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්

(i) අංක 01 සිට 04 තෙක් ඡේදයෙන් පළමුවැනි පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු ය.

(iii) දැනටමත් රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ 01 සිට 12 දක්වා සියලුම කොටස් ද අනෙකුත් අයදුම්කරුවන් අංක 01 සිට 11 දක්වා සියලුම කොටස් ද සම්පූර්ණ කර අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ද, අසම්පූර්ණ ලෙස එවා ඇති ඉල්ලුම්පත්‍ර ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු අතර එක් එක් විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එසේ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 පෙබරවාරි 23 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පතේ ඇතුළත් තොරතුරුවලට අනුව නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශපත්‍ර නොලැබුනි නම් පහත තොරතුරු සමඟ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු ය :-

(1) අයදුම්පත් හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක්,

(2) ලියාපදිංචි කළ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක්.

11. *අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. මේ සඳහා

(*අ*) ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත, හෝ

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමට පසුව තෝරා ගැනීම් කිරීම, පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම්/තීරණ ගැනීමේ අයිතිය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2016 ජනවාරි මස 07 වැනි දින,
දුරකථන අංකය : 037-2233769

ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

ඉල්ලුම් කරනු ලබන තනතුර (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ✓ලකුණ යොදන්න)

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

01. නම :

1.1 මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss. :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදා.* RATHNAYAKA R. M. T.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය :————————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————————.
2.4 දුරකථන අංකය :————————.

03. 3.1 ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - F ☐ පුරුෂ - M ☐
3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
3.3 2016.02.23 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

04. 4.1 අයැදුම්කරු අයත්වන පරිපාලන දිස්ත්‍රික්කය :————————.
4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————.
4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————————.

05. අධ්‍යාපන සුදුසුකම් :
5.1 අ.පො.ස. (සා පෙළ) විභාගය පිළිබඳ විස්තර :
පළමුවර - වර්ෂය හා මාසය :————————. විභාග අංකය :————————.
දෙවනවර - වර්ෂය හා මාසය :————————. විභාග අංකය :————————.

| | විෂයය | පළමුවර සාමාර්ථය | දෙවනවර සාමාර්ථය | | විෂයය | පළමුවර සාමාර්ථය | දෙවනවර සාමාර්ථය |
|---|---|---|---|---|---|---|---|
| 01 | | | | 06 | | | |
| 02 | | | | 07 | | | |
| 03 | | | | 08 | | | |
| 04 | | | | 09 | | | |
| 05 | | | | 10 | | | |

5.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :
විභාගයේ වර්ෂය හා මාසය :————————.
විභාග අංකය :————————.

| | විෂයය | සාමාර්ථය | | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 03 | | |
| 02 | | | 04 | | |

06. තාක්ෂණ සුදුසුකම් :

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

07. වෙනත් සුදුසුකම් :————————.

08. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? :
ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ ලකුණු කරන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

09. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/තැපැල් කාර්යාලය :———————.
(ii) ලදුපත් අංකය/මුදල් ඇණවුම් අංකය/දිනය හා ගෙවූ මුදල :———————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

10. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තව ද මේ සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි. විභාගයේ සියලුම කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

———————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :———————.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................... මයා./මිය./මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .......................................... දින ඔහුගේ/ඇයගේ අත්සන ලැබූ බව ද සහතික කරමි.

———————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :———————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———————.
තනතුර :———————.
ලිපිනය :———————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරමි.)

12. *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

ඉහත තොරතුරු සඳහන් ......................................................... මයා./මිය./මෙනවිය ................................................... කාර්යාලයේ සේවය කරන ලද බව ද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :———————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———————.
තනතුර :———————.
ලිපිනය :———————.

**ඇමුණුම 1 :- විස්තරාත්මක විෂය නිර්දේශය**

01. කෘෂිකර්ම උපදේශක හා සත්ත්ව සංවර්ධන උපදේශක :
(i) අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 ලකුණු 100)
අයැදුම්කරුවන්ගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

02. සත්ත්ව සංවර්ධන උපදේශක :
(ii) සාමාන්‍ය දැනීම (කාලය පැය 1 1/2 ලකුණු 100)
දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික, සමාජයීය, විද්‍යාත්මක, තාක්ෂණික හා ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයින්ගේ දැනුම මැනීමට සකස් වන විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයකි.

03. කෘෂිකර්ම උපදේශක :-

(iii) තාක්ෂණ ප්‍රශ්න පත්‍රය : (කාලය පැය 03 කි. ලකුණු 100)

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දයකත්වය :
   (අ) දළ ජාතික නිෂ්පාදනයට කෘෂි කර්මාන්තයේ දායකත්වය.
   (ආ) රැකියා නියුක්තිය.
   (ඇ) අපනයන හා ආනයනයේ දී කෘෂිකර්මාන්තයට හිමි තැන.

2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම.

3. පස හා ශාක පෝෂණය :
   (අ) පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලක්ෂණ, බෝග වගාව කෙරෙහි එහි බලපෑම.
   (ආ) ශාක පෝෂණය පාංශු/ශාක පෝෂණය කළමනාකරණය.
   (ඇ) පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු.

4. වී නිෂ්පාදනය :
   (අ) පාංශු හා දේශගුණික අවශ්‍යතාවය.
   (ආ) ප්‍රභේද.
   (ඇ) බිම් සකස් කිරීම හා තවාන් පාලනය.
   (ඈ) පිළිබෝධ හා රෝග මර්දනය.
   (ඉ) පොහොර යෙදීම.
   (ඊ) ජල කළමනාකරණය/අස්වනු වැඩි කර ගැනීමේ නූතන ක්‍රමවේදයන්.
   (උ) අස්වනු නෙළීම හා පසු තාක්ෂණික විධි.
   (ඌ) බිත්තර වී නිෂ්පාදනය.

5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය :
   (අ) ලොකු ළූණු, මිරිස්, අර්තාපල්, බඩ ඉරිඟු සහ වෙනත් බෝගවල ප්‍රභේද, පාංශු හා දේශගුණික අවශ්‍යතා හා රෝපණ ක්‍රියාකාරකම්, ගබඩා සහ අලෙවිකරණය, පසු අස්වනු තාක්ෂණය, වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීම.

6. එළවළු නිෂ්පාදනය :
   (අ) එළවළු තවාන් පාලනය.
   (ආ) එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම.

7. පළතුරු :
   (අ) පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම.

8. බෝග ආරක්ෂණය :
   (අ) බෝගවලට වැළඳෙන ප්‍රධාන රෝග හා පිළිබෝධ හඳුනා ගැනීම, ඒවායේ පාලන විධි.
   (ආ) වල් මර්දනය, වල් මර්දන ක්‍රම.
   (ඇ) පළිබෝධනාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම.

9. *පාංශු රසායන* - පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම.

10. වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය :
   (අ) විවිධ බෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය.
   (ආ) ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම.
   (ඇ) ජලවහනය හා එහි වැදගත්කම.

11. ගොවිපල යාන්ත්‍රීකරණය :
   (අ) ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි අවාසි.
   (ආ) බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ.
   (ඇ) ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ.
   (ඈ) ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව.

12. මීමැසි පාලනය :
   (අ) ආර්ථික වැදගත්කම.
   (ආ) මීමැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යෑම.
   (ඇ) අස්වනු ලබා ගැනීම හා වෙළෙඳ පොළට සකස් කිරීම.

13. මල් හා විසිතුරු පැළ වගාව හා භූමි අලංකරණය ඃ
    (අ) ආර්ථික වැදගත්කම.
    (ආ) භූමි අලංකරණය ක්‍රම.
    (ඇ) වෙළඳ පොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳපොළට සකස් කිරීම.
    (ඈ) වෙළඳ පොළ සඳහා විසිතුරු පැළ නිෂ්පාදනය.

14. ආරක්ෂිත බෝග වගාව ඃ
    (අ) වැදගත් ක්‍රම.
    (ආ) සැලසුම් කිරීම.
    (ඇ) බෝග තෝරා ගැනීම, ජලය/පොහොර යෙදීම.
    (ඈ) පවත්වාගෙන යාම හා අස්වනු සකස් කිරීම.

15. සත්ව පාලනය ඃ
    (අ) කුකුල් නිෂ්පාදනය හා කිරි ගව කර්මාන්තයේ ඇති වැදගත්කම.
    (ආ) සමෝදන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් නිෂ්පාදන පවත්වාගැනීම.

16. කෘෂිකාර්මික ව්‍යාප්තිය ඃ
    (අ) කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදයන්.
    (ආ) කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම.

01-786

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.